**2022.08.09 වන දින පෙ.ව. 09.30 ට හපුතලේ ප්‍රාදේශීය සභාවේ නව සභා රැස්වීම් ශාලාවේදී පැවති හපුතලේ ප්‍රාදේශීය සභා මාසික මහා සභා රැස්වීම් වාර්තාව**

**පැමිණීම**

| | | |
|---|---|---|
| 1. බී. කන්දසාමි මහතා | - | ගරු සභාපති |
| 2. වයි.එම්.නිමල් අමරසිරි මයා | - | ගරු උපසභාපති |
| 3. එස්. සගාදේවන් මයා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 4. ආර්.එම්. ඉන්ද්‍රතිලක රාමනායක මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 5. සවරිමුත්තු ප්‍රභාහර් මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 6. මාරප්පන් කන්දසාමි මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 7. එච්.ඒ.ඩී. චාන්දනී මානෙල් කුමාරි මිය | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිණී |
| 8. කේ.ඒ. චන්දන කිත්සිරි පෙරේරා මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 9. ඊ.එම්. සීගිරි ලංකා ඒකනායක මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 10. එල්.එච්. ඉන්දික සම්පත් මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 11. එෆ්. වයලට් රෝස් මහත්මිය | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිණී |
| 12. ගෝපාලන් මුරුගන් මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 13. තංගවේලු මහේන්ද්‍රන් මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 14. ඩී. සුදත් අරුණ රංජන මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 15. එම්.ඒ. නිල්මිණී චන්ද්‍රකාන්ති මිය | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිණී |
| 16. වේලුසාමි එලීල් අරසි මිය | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිණී |
| 17. ආර්.එල්.සුදර්ශන මහතා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |

**01.පසුගිය රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම**

හපුතලේ ප්‍රාදේශීය සභාවේ 2022.07.12 වන දින පවත්වන ලද මාසික මහ සභාවෙ හි මහ සභා වාර්තාව කියවූවා සේ සළකා සභා සම්මත කිරීම සිදු කරන ලෙස ගරු මූලාසනය විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා විසින් පසුගිය මහ සභා වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරන ලද අතර, එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී එම්.ඒ. නිල්මිණී චන්ද්‍රකාන්ති මහත්මිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව පසුගිය මහ සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**02. සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය**
**අතිවිශේෂ**
**අංක 2287/20 – 2022 ජූලි මස 06 වැනි බදාදා - 2022.07.06**
**IV (ආ) වැනි කොටස - පළාත් පාලනය**

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ 10 අ (1)(අ) වගන්තිය යටතේ දැන්වීම.**

**හපුතලේ ප්‍රාදේශීය සභාව**

හපුතලේ ප්‍රාදේශීය සභාවේ සභිකයකු වන රත්නායක මුදියන්සේලාගේ අනුලාවතී මල්ලිකා මහත්මිය , එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයකුව සිටීම අවසන් කර ඇති නිසා එම සභාවේ ඇයගේ සභික ධූරය ඇය විසින් අතහැර ඇති බව, හපුතලේ ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි කාන්දිරාසා කාන්දීපන් වන මම, (262 වැනි අධිකාරය වූ ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ 10 අ (1)(අ) වැනි වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි.

කේ. කාන්දීපන් ,
තේරීම්භාර නිලධාරී,
හපුතලේ ප්‍රාදේශීය සභාව.

2022 ජූලි මස 06 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
බදුල්ල.

- 2022-07-25 වන දින ඌප/දි/සෙසැලි අංක දරණ ලිපියට අදාළව හපුතලේ ප්‍රාදේශීය සභාවේ 2011 වසරේ ආරම්භ කරන ලද ඉන්දියන් නිවාස ව්‍යාපෘතිය යටතේ නිවාස 40ක් සඳහා විදුලිය ලබා ගැනීම සම්බන්ධයෙන් යොමු කර ඇති ලිපිය

- ජාතික විගණන කාර්යාලයෙන් ලද 2022-06-07 දිනැති හපුතලේ ප්‍රාදේශීය සභාවේ 2021-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව පරිදි මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද තත්ත්වාගණනය කළ මතය

## 03. සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්. සුදර්ශන මහතා

- පොලිස්කන්ද , ගස්වත්ත ප්‍රදේශවාසීන් විසින් දියතලාව ගස්වත්ත මැදින් යන කුණු කානු පද්ධතිය ඉවත් කර ගැනීම සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති ලිපිය

## 04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න.

නැත

## 05. යථා පරිදි කල් දී ඇති යෝජනා

**යෝජනා අංක 01**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

වර්තමානයේ පවතින ඉන්ධන හිඟය හේතුවෙන් නගරයට වාහන නොපැමිණීම නිසා පොළ බදු හා වාහන බදු අය කිරීමට අපහසු වූ බැවින් සහනයක් ලබා දෙන ලෙසත් ගිවිසුම් ගත දෛනික කුළී මුදල වන රු.2070.00ක මුදල සඳහා ඉන්ධන හිඟය සමනය වන තුරු සහනයක් ලබා දෙන ලෙසට හපුතලේ ප්‍රාදේශීය සභාවේ පොළ බදු හා වාහන බදු ටෙන්ඩර්කරු වන හපුතලේ , පංකැටිය වත්ත , ලිපිනයේ පදිංචි කේ. ශාන්ත කුමාර් මහතා විසින් සිදු කර ඇති ඉල්ලීම් ලිපි පළාත් පලාන දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමෙන් අනතුරුව 2022-07-28 වන දින ලද ලිපියට අනුව එමගින් දන්වා ඇති පරිදි පත් කරන ලද කමිටුව මගින් ලද අදාල සාධාරණීකරණ වාර්තාව අනුව,

I. වාහන හා පොළ බදු ටෙන්ඩර්කරු විසින් ඉල්ලා ඇති පරිදි 2022 ජූලි මස සිට මෙම අර්බුදකාරී තත්ත්වය සමනයකට පත්වන තෙක් දෛනිකව අය කරන ටෙන්ඩර් ගත බදු ගාස්තුවෙන් 25% ක් පමණ අඩු කිරීමටත්,

II. 2022.06.30 හා 2022.07.01 දිනයන් සඳහා ගාස්තුවෙන් නිදහස් කිරිමටත්,

III. 2022.07.04 සිට 2022.07.18 කාලය තුළ රටේ පැවති ඉන්ධන හිඟය හේතුවෙන් බදු මුදල් අය කර නොමැති බැවින් එම දිනයන් සඳහා බදු මුදල් අය කිරීමෙන් නිදහස් කිරීමත්,ඒ අනුව එකී හිඟ මුදල වන රු.28,980.00ක මුදල ලේඛන වලින් කපා හැරීම සිදු කළ යුතු බවත්,

IV. 2022.07.19 දින සිට මෙම අර්බුදකාරි තත්ත්වය සමනයකට පත්වන තුරු ටෙන්ඩර් ගත බදු මුදලෙන් 75% ක් පමණ අය කිරීමට කටයුතු කිරීම සාධාරණ බවත්,

කමිටුව විසින් නිර්දේශ කර ඇති අතර එකී නිර්දේශය මත ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්. සුදර්ශන මහතා

විවාද

වර්තමානයේ පවතින ඉන්ධන හිඟය හේතුවෙන් නගරයට වාහන නොපැමිණීම නිසා පොළ බදු හා වාහන බදු අය කිරීමට අපහසු වූ බැවින් සහනයක් ලබා දෙන ලෙසත් ගිවිසුම් ගත දෛනික කුළී මුදල වන රු.2070.00ක මුදල සඳහා ඉන්ධන හිඟය සමනය වන තුරු සහනයක් ලබා දෙන ලෙසට හපුතලේ ප්‍රාදේශීය සභාවේ පොළ බදු හා වාහන බදු ටෙන්ඩර්කරු වන හපුතලේ , පංකැටිය වත්ත , ලිපිනයේ පදිංචි කේ. ශාන්ත කුමාර් මහතා විසින් සිදු කර ඇති ඉල්ලීම් ලිපි පළාත් පලාන දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමෙන් අනතුරුව 2022-07-28 වන දින ලද ලිපියට අනුව එමගින් දන්වා ඇති පරිදි පත් කරන ලද කමිටුව මගින් ලද සාධාරණීකරණ වාර්තාව අනුව,

I. වාහන හා පොළ බදු ටෙන්ඩර්කරු විසින් ඉල්ලා ඇති පරිදි 2022 ජූලි මස සිට මෙම අර්බුදකාරී තත්ත්වය සමනයකට පත්වන තෙක් දෛනිකව අය කරන ටෙන්ඩර් ගත බදු ගාස්තුවෙන් 25% ක් පමණ අඩු කිරීමටත්,

II. 2022.06.30 හා 2022.07.01 දින සඳහා ගාස්තුවෙන් නිදහස් කිරීමටත්,

III. 2022.07.04 සිට 2022.07.18 කාලය තුළ රටේ පැවති ඉන්ධන හිඟය හේතුවෙන් බදු මුදල් අය කර නොමැති බැවින් එම දිනයන් සඳහා බදු මුදල් අය කිරීමෙන් නිදහස් කිරීමත්,ඒ අනුව එකී හිඟ මුදල වන රු.28,980.00ක මුදල ලේඛන වලින් කපා හැරීම සිදු කළ යුතු බවත්,

IV. 2022.07.19 දින සිට මෙම අර්බුදකාරී තත්ත්වය සමනයකට පත්වන තුරු ටෙන්ඩර් ගත බදු මුදලෙන් 75% ක් පමණ අය කිරීමට කටයුතු කිරීම සාධාරණ බවත්,

කමිටුව විසින් නිර්දේශ කර ඇති අතර එකී නිර්දේශය මත ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ආර්.එල්. සුදර්ශන මහතා විසින් අදහස් දක්වමින් පසුගිය කාල වකවානුව තුළ ඉන්ධන හිඟය හේතුවෙන් නගරයට වාහන නොපැමිණීම හේතුවෙන් සභාවට ආදායමක් ලබා ගැනීමට නොහැකි වූ නමුත් මෙය පවත්වාගෙන යායුතු බැවින් ටෙන්ඩර්කරු වෙත සහනයක් ලබා දී අදාළ කටයුතු පවත්වාගෙන යාම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්. සීගිරි ලංකා ඒකනායක මහතා අදහස් දක්වමින් ටෙන්ඩර්කරු වෙත සහනයක් ලබා දී හෝ අදාළ කටයුතු පවත්වාගෙන යාම සුදුසු බවත් නොඑසේ නම් නීතියක් නොමැති වුවහොත් එකී කටයුතු අයාලේ යන බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. සුදත් අරුණ රංජන මහතා මෙන්ම ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී. මහේන්ද්‍රන් මහතා ද පසුගිය කාල වකවානුව තුළ සභාවට ආදායමක් නොලැබූ බැවින් සහන ලබා දීම මත ඉදිරි කටයුතු පවත්වාගෙන යාම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමන් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් දෛනික කුලී මුදලින් 25%ක ප්‍රතිශතයක් අඩු කර පොළ බදු හා වාහන බදු අය කිරීම පවත්වාගෙන යාම සුදුසු බවත් ඒ සඳහා අවශ්‍ය අනුමැතිය පළාත් පාලන කොමසාරිස්තුමන්ගෙන් ලබා ගෙන ඒ සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු ගිවිසුම් ගත කාලය අවසන් වන තෙක් සිදු කිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 02**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

හපුතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලද 2022-07-06 දිනැති ලිපිය ප්‍රකාරව අ.ග.පි. 387 හි අතිරේක අංක 08 හි පත්‍ර අංක 09 කැබලි 785 දරණ රජයේ ඉඩම් මතින් දිවෙන මාර්ගය ප්‍රාදේශීය සභා මාර්ගයක් ලෙස ගැසට් කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්තුමන් විසින් එකඟතාවය ලබා දී ඇති අතර එකී මාර්ගය ප්‍රාදේශීය සභා මාර්ගයක් ලෙස ගැසට් කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා

විවාද

හපුතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලද 2022-07-06 දිනැති ලිපිය ප්‍රකාරව අ.ග.පි. 387 හි අතිරේක අංක 08 හි පත්‍ර අංක 09 කැබලි 785 දරණ රජයේ ඉඩම් මතින් දිවෙන මාර්ගය ප්‍රාදේශීය සභා මාර්ගයක් ලෙස ගැසට් කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්තුමන් විසින් එකඟතාවය ලබා දී ඇති අතර එකී මාර්ගය ප්‍රාදේශීය සභා මාර්ගයක් ලෙස ගැසට් කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 03**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත සහ ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2020.10.29 දින පනවන ලද රීති අනුව 2023 වර්ෂය සඳහා යෝජිත වියදම් ඇස්තමේන්තුව සහ යෝජිත ආදායම් හා ලැබීම් ඇස්තමේන්තුව පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා ගරු මහජන නියෝජිතයන්ගෙන් සමන්විත කමිටුවක් පත් කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. සුදත් අරුණ රංජන මහතා

විවාද

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත සහ ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2020.10.29 දින පනවන ලද රීති අනුව 2023 වර්ෂය සඳහා යෝජිත වියදම් ඇස්තමේන්තුව සහ යෝජිත ආදායම් හා ලැබීම් ඇස්තමේන්තුව පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා ගරු මහජන නියෝජිතයන්ගෙන් සමන්විත කමිටුවක් පත් කිරීම සුදුසු බවට ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව ගරු සභාපතිතුමන් ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයේ සියලුම සාමාජිකයන්ගෙන් සැදුම්ලත් කමිටුවක් පත් කිරීම සුදුසු බව යෝජනා වූ අතර මේ යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලදී. ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 04**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

2022 සැප්තැම්බර් මස මහ සභාව පැවැත්වෙන දිනය තීරණය කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා

විවාද

2022 සැප්තැම්බර් මස මහ සභාව පැවැත්වෙන දිනය ලෙස සැප්තැම්බර් මස නවවන දිනය තීරණය කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 05**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

හපුතලේ ප්‍රාදේශීය සභාවේ සභාපති ලෙස කටයුතු කරන මාගේ රාජකාරී කටයුතු පහසු කර ගැනීම සඳහා මේ වන තෙක් පෞද්ගලික ලේකම් ලෙස කටයුතු කරන ලද ආර්.රාධා මෙනවිය වෙනුවට රාජකාරී කටයුතු පහසු කර ගැනීම සඳහා 2022 අගෝස්තු මස සිට බී. රම්‍යාශිනී මෙනවිය යොදවා ගැනීම සුදුසු බව යෝජනා කරන්නීය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා

විවාද

හපුතලේ ප්‍රාදේශීය සභාවේ සභාපති ලෙස කටයුතු කරන මාගේ රාජකාරී කටයුතු පහසු කර ගැනීම සඳහා මේ වන තෙක් පෞද්ගලික ලේකම් ලෙස කටයුතු කරන ලද ආර්.රාධා මෙනවිය වෙනුවට රාජකාරී කටයුතු පහසු කර ගැනීම සඳහා 2022 අගෝස්තු මස සිට බී. රම්‍යාශිනී මෙනවිය යොදවා ගැනීම සුදුසු බව යෝජනා කරන්නීය.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**06. කාරක සභා වර්තාව**

2022.08.02 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තා සභාව වෙත ඉදිරිපත් කරන ලද අතර, මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාවෙ හි හිටපු ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී ආර්.එම්. අනුලාවතී මල්ලිකා මහත්මියගේ නම සටහන් වී ඇති බැවින් අනුමත කළ නොහැකි බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. සුදත් අරුණ රංජන මහතා විසින් ප්‍රකාශ කළ අතර ගරු සභාපතිතුමන් විසින් බලතල ප්‍රකාරව එකී වාර්තාවල සඳහන් නම කපා හැර කෙටි අත්සන් යෙදීමෙන් අනතුරුව 2022.08.02 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව සඳහා ගරු සභාවේ එකඟතාවය ලැබිණි.

**07. ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ**

2022 ජූලි මස ලැබීම් හා වියදම් පිළිබඳ මාසික වාර්තාව සභාව වෙත ඉදිරිපත් කරන ලද අතර, ජූලි මස වියදම් වාර්තාවේ අංක 25 යටතේ සඳහන් ඉන්ධන සඳහා ගෙවීම් යටතේ දක්වා ඇත්තේ 03/16 සිට 04/30 දක්වා බැවින් මැයි ,ජූනි හා ජූලි සඳහා ඉන්ධන සඳහා තවදුරටත් ගෙවීම් සිදු කිරීමට තිබේ ද යන්න විමසන ලදී. අංක 31 යටතේ අතිකාල හා ගමන් වියදම් සඳහා වියදම දරා ඇත්තේ කුමන මාසය සඳහා ද යන්න විමසන ලද අතර නැවත වියදම සඳහන් කිරීමේ දී අදාළ මාසය සඳහන් කරන ලෙස ප්‍රකාශ කරන ලදී. අනතුරුව 2022 ජූලි මස ලැබීම් හා වියදම් පිළිබඳ මාසික වාර්තාව සඳහා ගරු සභාවේ එකඟතාවය ලැබිණි.

**08.වෙනත් කරුණු**

**08.1 ගරු මන්ත්‍රීවරුන්ගේ නිවාඩු**

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.එම්. විමලසිරි මහතා අසනීප නිවාඩු ලබා ඇති බැවින් 2022-08-09 වන දින සභාවට සහභාගී නොවීම සම්බන්ධයෙන් ගරු සභාව විසින් එකී සභිකයා වෙත අසනීප නිවාඩු ලබා දීම සුදුසු බවට එකඟතාවය පළ කරන ලදී.

**<u>08.2 ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස් දැක්වීම.</u>**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එච්. ඉන්දික සම්පත් මහතා විසින් අදහස් දක්වමින් දියතලාව බස් නැවතුම්පොළ භූමියෙ හි සෑදී ඇති විශාල වලවල් හේතුවෙන් බස් රථ බස් නැවතුම්පොළ භූමියට ඇතුලු කිරීමේ දී අපහසුතාවයට පත් වන බවත් එම වලවල් කඩිනමින් පිළිසකර කර දෙන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් මෙම වසර තුළ මීට පෙර අවස්ථාවකදී ද සභා අරමුදල් යොදා බස් රථ නැවතුම්පොළෙ හි තිබූ වලවල් ප්‍රතිසංස්කරණය කරන ලද අතර නැවතත් කාර්මික නිලධාරි විසින් ස්ථානීය පරීක්ෂණයක් සිදු කර වාර්තාවක් කඩිනමින් ලබා ගැනීමෙන් පසු මාර්ග සංවර්ධන අධිකාරියේ ඉංජිනේරුතුමන් ද සම්බන්ධ කර ගැනීමෙන් පසු මේ සඳහා ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. සුදත් අරුණ රංජන මහතා විසින් අදහස් දක්වමින් දියතලාව ප්‍රාදේශීය සභාව සතු පොළ භූමිය සම්බන්ධ වර්තමාන තත්ත්වය කෙසේ ද යන්න විමසන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් පුරා විද්‍යා දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැගිල්ල නිදහස් කර ගැනීම සඳහා කොට්ඨාසභාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීතුමන් සමඟ මේ වන විට සාකච්ඡා සිදු කර ඇති අතර ඉඩම මැනුම් කර ප්‍රාදේශීය සභාවට පවරා ගැනීම සිදු කරන බව ප්‍රකාශ කරන ලදී.මේ සම්බන්ධයෙන් අදාළ සියලු ලියකියවිලි මේ වන විට ඉඩම් කොමසාරිස් කාර්යාලයට භාර දී ඇති බවද වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස් . සගාදේවන් මහතා විසින් අදහස් දක්වමින් වතු ක්ෂේත්‍රයේ නියුතු කම්කරුවන් විශ්‍රාම යාමේ දී ඔවුන්ට හිමි සේවක අර්ථ සාධක අරමුදල් ලබා ගැනීමට කටයුතු කිරීමේදී කම්කරු කාර්යාලයෙ හි සිදු වන අපහසුතාවය පිළිබඳ ප්‍රකාශ කළ අතර කම්කරු කාර්යාලය මගින් දිනකට සීමිත ටෝකන්පත් ප්‍රමාණයක් පමණක් ලබා දෙන බැවින් දුර ප්‍රදේශවලින් පැමිණෙන සේවාලාභීන් බොහෝ අවස්ථාවලදී අපහසුතාවයට පත් වන බවත් ඇතැම් අවස්ථාවලදී කාර්යාල කටයුතු සිදු කර ගැනීමට යාමේ දී කම්කරුවන්ගේ කාලය නාස්තිවන බවත් ප්‍රකාශ කළ අතර මීට පිළියමක් ලෙස වතු කම්කරුවන් සඳහා දිනයක් වෙන් කර දෙන ලෙසත් මේ පිළිබඳව සලකා බලා වතු කම්කරුවන්ගේ රාජකාරී කටයුතු ඉටු කර ගැනීම පහසු කිරීම සඳහා සභාපතිතුමන් මැදිහත් වී සාකච්ඡා කර අවශ්‍ය කටයුතු සිදු කර දෙන මෙන් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී. මහේන්ද්‍රන් මහතා විසින් අදහස් දක්වමින් කම්කරු කාර්යාලය මගින් දිනකට සීමිත ටෝකන්පත් ප්‍රමාණයක් පමණක් ලබා දෙනු ලැබුවද කම්කරුවන් විශාල ප්‍රමාණයක් මෙන්ම රාජ්‍ය සේවකයින් ද විශාල ප්‍රමාණයක් මෙහි සේවාව ලබා ගැනීමට යාමේ දී මහත් අපහසුතාවයට පත් වන බවත් මීට පිළියමක් ලෙස රාජ්‍ය සේවකයින්හට එක් දිනක් හා වතු කම්කරුවන් සඳහා එක් දිනයක් ලෙස වෙන් කර දීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් සාකච්ඡාවක් සිදු කිරීම සුදුසු බවත් ඒ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. ප්‍රභාගර් මහතා අදහස් දක්වමින් රාජ්‍ය වියදම් පාලනය කිරීම - රාජ්‍ය අයවැය චක්‍රලේඛ අංක 3/2022 ට අදාළ චක්‍රලේඛයෙහි පිටපතක් ලබා ගත හැකිද යන්න විමසන ලද අතර එකී පිටපත දෙමළ භාෂාවට පරිවර්තනය කොට ලබා ගත හැකිද යන්න විමසන ලද අතර ඊට පිළිතුරු වශයෙන් ගරු සභාපතිතුමන් විසින් අන්තර්ජාලය හරහා 3/2022 චක්‍රලේඛනය භාගත කර ගන්නා ලෙසට උපදෙස් ලබා දෙන ලදී.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා අදහස් දක්වමින් ගම් සභා පාරවල් හෙවත් කැටගල් , කොන්ක්‍රීට් , කාපට් මාර්ග වලට සිදු වන හානිය සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කරන ලදී. ජල සම්පාදන මණ්ඩලය විසින් ජල නල එලීමේ දී ප්‍රාදේශීය සභාවේ අවසරය මත හෝ අවසර නොමැතිව හෝ මාර්ග පලුදු කරනු ලබන බවත් එම ස්ථාන බොහෝ විට නැවත පිළිසකර කිරීමක් සිදු නොකරන බවත් ඒ හේතුවෙන් ගම් සභා මාර්ග මේ වන විට අබලන් වී ඇති බවත් , වර්තමාන තත්ත්වය හමුවේ සංවර්ධන කටයුතු සඳහා ප්‍රතිපාදන වෙන් වී නොමැති පසුබිමක මෙවැනි මාර්ග නැවත පිළසකර කිරීමට මුදල් නොමැති වීම හේතුවෙන් සභාව සතු මාර්ග රැක ගත යුතු බවත් ඒ සඳහා දැඩි පියවර ගත යුතු බවත් , උදාහරණයක් ලෙස මැණික් කන්ද වැව ළඟ පිහිටි

මාර්ගයෙ හි කාණුව කඩා අම්පිටිගොඩ ප්‍රදේශයට ජල නළ එලීමක් සිදු කර ඇති අතර මේ වන තුරු එම කාණුව නැවත සකස් කිරීමක් සිදු කර නොමැති බවත් කාර්මික නිලධාරී මහතා මේ සම්බන්ධයෙන් මැදිහත් වී මෙලෙස හානියට පත් මාර්ග සම්බන්ධයෙන් අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන ලෙසත් ප්‍රකාශ කරන ලදී.
තවද දොඩම්වත්ත මාර්ගයේ මෙන්ම මැණික්කන්ද මාර්ගයේ ද බස් රථයක් හෝ යෙදීමට කටයුතු සිදු කරන්නේ නම් වර්තමාන ආර්ථික ගැටලුකාරී තත්ත්වය හමුවේ මෙය ප්‍රජාව වෙත විශාල සහනයක් බවත් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් අදහස් දක්වමින් අබලන් වී ඇති ගම් සහා මාර්ග කාර්මික නිලධාරි මහතා මැදිහත් වී නිරීක්ෂණය කොට ලබා ගන්නා ලද ඡායාරූප ඇතුළත් වාර්තාවක් කඩිනමින් ලබා ගැනීම හරහා අවශ්‍ය කටයුතු සිදු කරන බව ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. ඉන්ද්‍රතිලක රාමනායක මහතා අදහස් දක්වමින් හපුතලේ ප්‍රාදේශීය සභාව සඳහා එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් මන්ත්‍රී ධූර 07 ක් හිමි වූ බවත් මේ වන විට මන්ත්‍රීධූර 02ක් අහෝසි වී ඇති බවත් පක්ෂ මහලේකම් හරහා නැවත මන්ත්‍රීධූර දෙකක් පත් කිරීම සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කළ යුතු බවත් ප්‍රකාශ කරන ලදී.
එසේම ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. ප්‍රභාගර් මහතා විසින් සිදු කරන ලද ප්‍රකාශය සම්බන්ධයෙන් තමන් තව දුරටත් පැහැදිලි කිරීමක් සිදු කරන බවත් ඌව පළාත් පාලන කොමසාරිස්තුමන්ගේ 2022-05-17 වන දිනැති අංක 12/4/3/1/19 දරණ රාජ්‍ය වියදම් පාලනය කිරීම - රාජ්‍ය අයවැය චක්‍රලේඛ අංක 3/2022 ලිපිය සභාගත කරන ලදී.ලිපිය සභා ගත කිරීමෙන් අනතුරුව එහි සඳහන් වනුයේ සභා අරමුදලින් සිදු කරනු ලබන සුභ සාධන වියදම් දැරීම සිදු කළ නොහැකි බවත් සංවර්ධන කාර්යයන් සිදු කිරීම සම්බන්ධයෙන් සීමාවක් මෙහි සඳහන් නොවන බවත් , 2021 වර්ෂයේ දී 2022 වර්ෂය සඳහා ක්‍රියාත්මක කළ යුතු යෝජනා ඇතුළත් අයවැය සම්මත කිරීම සඳහා ඡන්දය ලබා දීම සිදු කරනුයේ ගරු මන්ත්‍රී මණ්ඩලය නියෝජනය කරනු ලබන ග්‍රාම සේවා වසම් සඳහා කුමන හෝ සේවාවක් සිදු කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කර මහජනතාවට එකී කටයුතු සිදු කර පහසුව සැලසීම සඳහා බවත් එකී මුදල් පමණක් කප්පාදු කර සභාවේ ගරු සභාපතිතුමා ඇතුලු කාර්ය මණ්ඩලය වෙත පමණක් සියලු පහසුකම් සපයනවානම් මෙයට විරුද්ධබවත්, මෙම චක්‍රලේඛය සමඟ එකඟ විය නොහැකි බවත් ගරු සභික මණ්ඩලය මේ සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස්තුමන් දැනුවත් කරන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් සභා ගත කරන ලද ලිපිය මින් පෙර එනම් 2022-06-09 වන දින සංදේශ හා පෙත්සම් යටතේ එකී ලිපිය සභාවට ඉදිරිපත් කළ බවත් කළ ප්‍රජාව වෙනුවෙන් හැකි දෙයක් පවතී නම් තමා ඕනෑම වේලාවක ඒ සඳහා කැප වී කටයුතු කරන බවත් මෙම චක්‍රලේඛය හපුතලේ ප්‍රාදේශීය සභාවට අනුගත කර ගනුයේ කෙසේද යන්න සම්බන්ධයෙන් 2022-07-12 වන දින හපු/ප්‍රාස/1/4 ලිපිය මගින් පළාත් පාලන කොමසාරිස්තුමන්ගෙන් උපදෙස් විමසන ලද බවට ප්‍රකාශ කළ අතර එකී උපදෙස් විමසන ලද ලිපිය සභාපතිතුමන්ගේ උපදෙස් පරිදි සභා ගත කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. ඉන්ද්‍රතිලක රාමනායක මහතා නැවතත් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් සභාපතිතුමන්ගේ ඉල්ලීම නිවැරදි බවත් චක්‍රලේඛයෙ හි සුභ සාධක වියදම් දැරීම

පමණක් සීමා කිරීම සිදු කර ඇති බවත් සංවර්ධන වියදම් පිළිබඳව සඳහනක් නොවන බවත් නැවතත් සඳහන් කරන ලදී.

සභාපතිධූරයේ කටයුතු කරනු ලබන මා විසින් නිරන්තරයෙන්ම ප්‍රජාව සඳහා සහන සැලසීමට කටයුතු කරන බවත් එසේම ගරු සභික මණ්ඩලය වෙත ඕනෑම අවස්ථාවක අවශ්‍ය කටයුතු සිදු කිරීමට බැඳී සිටින බවත් ප්‍රකාශ කළ අතර සභාව වෙත ලැබෙන ලිපි සංදේශ හා පෙත්සම් යටතේ සභා ගත කරනු ලබන බවත් , ලේකම්තුමිය විසින් සියලු කටයුතු සිදු කරනුයේ චක්‍රලේඛවලට අනුව බවත් නොඑසේ නම් එයින් මතුවන අර්බුදකාරී තත්ත්වය මත ලේකම්තුමිය වගකීමට බැඳෙන බවත් සභාවට අදාල මූලික කරුණු සඳහා පාදක වන ලිපි සභාව අවසන් වූ මොහොතේම අදාල ආයතන වෙත යොමු කරන බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමන්ගේ උපදෙස් පරිදි 3/2022 චක්‍රලේඛය සභා ගත කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. ඉන්ද්‍රතිලක රාමනායක මහතා නැවතත් අදහස් දක්වමින් චක්‍රලේඛයේ සඳහන් පරිදි සෞඛ්‍ය කම්කරුවාගේ සිට ලේකම්, සභාපති දක්වා වියදම් පාලනය කප්පාදුව තිබිය යුතු බවත් හපුතලේ ප්‍රාදේශීය සභාවේ මේ වන විට සිදුව තිබෙන්නේ ගරු මන්ත්‍රී මණ්ඩලයේ ප්‍රතිපාදනයන් හි කප්පාදුව පමණක් බවත් සඳහන් කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් අදහස් දක්වමින් සභාපති ලෙස තමාට හෝ ලේකම්තුමියහට ගරු මන්ත්‍රී මණ්ඩලය වෙත වෙන් කරනු ලබන ප්‍රතිපාදන අහිමි කිරීමට කුමන හෝ අවශ්‍යතාවයක් නොමැති බවත් චක්‍රලේඛය සභා ගත කරන ලෙස පැවසුවේ මෙම චක්‍රලේඛය නිකුත් කිරීමෙන් සංවර්ධන කටයුතු සියල්ල නතර කිරීමට සිදුව ඇති බව නැවත නැවතත් පෙන්වා දීම සඳහා බව වැඩිදුරටත් පැහැදිලි කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්. සුදර්ශන මහතා අදහස් දක්වමින් තම කොට්ඨාසයන් සඳහා වෙන් කළ ප්‍රතිපාදන මේ වන තෙක් නොලැබුණු පසුබිමක ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. ඉන්ද්‍රතිලක රාමනායක මහතා පමණක් ප්‍රතිපාදන වෙන් කරගනු ලැබුවේ කෙසේද යන්න විමසන ලදී.3/2022 චක්‍රලේඛය නිකුත් වීමට පෙර එකී ප්‍රතිපාදන වෙන් කර ගත් බව ගරු සභාපතිතුමා විසින් පෙන්වා දෙන ලදී.

ගරු සභාපතිතුමන් විසින් අදහස් දක්වමින් මේ වන විට සභාව සතුව ප්‍රතිපාදන නොමැති බවත්, කිසිදු ආදායමක් සභාවට නොලැබෙන බවත් මේ වන විට රථ වාහනවල රක්ෂණ වාරික පවා ගෙවීමට නොහැකි තත්ත්වයක් උද්ගත වී ඇති බවත් ඒ සඳහා සභාපතිතුමන් හා ලේකම්තුමිය මැදිහත් වී ගරු ආණ්ඩුකාරතුමන් හරහා ආධාරයක් ලබා ගැනීමට කටයුතු සිදු කළ ද එම උත්සාහය පවා ව්‍යර්ථ වූ බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්. එච්. ඉන්දික සම්පත් මහතා අදහස් දක්වමින් වර්තමානයේ කිවු ආර් කෝඩ් ක්‍රමය හරහා කුලී ත්‍රී රෝද රථ සඳහා ඉන්ධන ලබා දීමේ දී ලැබෙන ලීටර් 5ක ප්‍රමාණය කෙසේවත් ප්‍රමාණවත් නොවන බවත් බණ්ඩාරවෙල ආරියදාස පිරවුම්හල මගින් කුලී ත්‍රී රෝද රථ සඳහා ඉන්ධන ලබා දීමට කටයුතු සිදු කරන බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. සුදත් අරුණ රංජන මහතා අදහස් දක්වමින් සභාවට ආදායමක් නොලැබීමට පිළියමක් ලෙස ඉදිරියේ පවත්නා සභාවට හෝ ආදායමක් ලැබෙන ලෙස දිගු කාලීන

ප්‍රතිඵල ලැබෙන සේ , ස්ථිර ආදායම් ලැබෙන සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කිරීම සුදුසු බවත් පෞද්ගලික හෝ ඉඩමක් බදු දීම යටතේ ලබා ගෙන ගලි වලක් ඉදි කිරීම වඩාත් යෝග්‍ය බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් සංචාරක අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත දඹේතැන්න මාර්ගයේ නැරඹුම් මධ්‍යස්ථාන 03 ක් සංවර්ධනය කිරීමේ හැකියාව මත සභාවට විශාල ආදායමක් ලබා ගැනීමට හැකියාව පවතින බැවින් මේ වන විට ඒ සඳහා සංචාරක අමාත්‍ය ගරු හරීන් ප්‍රනානාදු මහතා සමඟ සාකච්ඡා කටයුතු සිදු කරන බවත් ගලි වලක් ඉදි කිරීම සඳහා පෞද්ගලික හෝ ඉඩමක් බදු දීම යටතේ ලබා ගැනීම සිදු කළද ඉදි කිරීම සඳහා ප්‍රතිපාදන ලබා ගනුයේ කෙසේ ද යන්න ප්‍රකාශ කරන ලදී.

මෙදින සභා රැස්වීම ප.ව.12.00ට අවසන් විය.

බී.කන්දසාමි,
සභාපති,
හපුතලේ ප්‍රාදේශීය සභාව,
දියතලාව.